ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1680/20 - 2010 නොවැම්බර් 18 වැනි බ්‍රහස්පතින්දා - 2010.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV (අ) වැනි කොටස - පළාත් සභා

පළාත් සභා නිවේදන

බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය

බස්නාහිර පළාත් සභාව විසින් 2010 ජුනි මස 08 වැනි දින අනුමත කරන ලදුව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2010 ඔක්තෝබර් මස 11 වැනි දින අත්සන් තබන ලද බස්නාහිර පළාතේ 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය 2010 ඔක්තෝබර් මස 11 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය උපාලි කොඩිකාර වන මම මෙයින් නියම කරමි.

උපාලි කොඩිකාර,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රවාහන,
ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,
සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ
ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2010 නොවැම්බර් මස 10 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ
අංක 204 දරන ස්ථානයේ පිහිටි
බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා
කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම්
සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

12-129

1A - PG 001194—650 (2010/11)

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 06 දරන සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ සමූපකාර සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

01. මේ ප්‍රඥප්තිය "2010 අංක 06 දරන බස්නාහිර පළාතේ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයාගේ අනුමතිය ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

I වැනි කොටස

සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිහිටුවීම

සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිහිටුවීම.

02. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා බස්නාහිර පළාතේ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් මෙයින් පිහිටවනු ලැබේ.

අධ්‍යක්ෂවරයා.

03. (1) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පරිපාලනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේය. අධ්‍යක්ෂවරයා තත්කාලයේ බස්නාහිර පළාතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් ධුරය දරන තැනැත්තාය. මේ ප්‍රඥප්තියේ 14 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් පාලක මණ්ඩලයේ මග පෙන්වීම යටතේ අධ්‍යක්ෂවරයා කටයුතු කළයුතු අතර, විශ්‍රාම වැටුප් අරමුදලේ පාලනය රීති මගින් නියම කරනු ලබන ආකාරයට විශ්‍රාම වැටුප් පාලක මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

කාර්ය මණ්ඩලය.

(2) බස්නාහිර පළාතේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පමණක් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලෙස යොදවාගත යුතු ය.

අධ්‍යක්ෂවරයාගේ දීමනා.

04. අධ්‍යක්ෂවරයා විසින් යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කාර්ය වෙනුවෙන් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

II වැනි කොටස

සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

යෝජනා ක්‍රමයට බැඳීමට සුදුසුකම්.

05. (1) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දිනට පෙර සේවයට බැඳී, මේ දක්වා සේවයේ යෙදී සිටින වයස අවුරුදු 18ට අඩු නොවූ සහ වයස අවුරුදු 60 දක්වා, ස්ථිර පත්වීමක් ලද සමූපකාර සේවකයෙකුට මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇත.

(2) විශ්‍රාම වැටුප් ලැබීමට අවම වශයෙන් ස්ථිර සේවකයෙකු ලෙස වසර දහය (10) ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන්. දායක විය යුතු බව.

06. මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට ස්ථිර සේවයට බැඳෙන සමූපකාර සේවකයින් මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන් දායක විය යුතුය.

දායක මුදල් ගෙවීම.

07. (1) මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කර ඇති ආකාරයට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකයාගෙන් අය කරනු ලබන දායක මුදල වන දායකයාගේ මූලික වැටුපෙන් 5% හා සේවායෝජක සමූපකාර සමිතිය හෝ සංගමය විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල වන දායකයාගේ මූලික වැටුපෙන් 2.5% ක් අදාළ සේවා යෝජක සමිතිය හෝ සංගමය විසින් 17 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කළ යුතුය.

(2) 7 (1) උප වගන්තිය යටතේ යෝජනා ක්‍රමය සඳහා ගෙවිය යුතු පෙර මස දායක මුදල ඊළඟ මස 15 වන දිනට පෙර 17 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. දායක මුදල් ප්‍රේෂණය කිරීම.

(3) 7 (1), (2) උප වගන්ති අනුව නියමිත දින විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ප්‍රේෂණය නොකරනු ලැබූ අවස්ථාවක දී, එම ගෙවිය යුතු දායක මුදලට අමතරව රීති මගින් නියම කරනු ලැබ ඇති ආකාරයට ගණනය කරන ලද අධිභාරයක් ද ගෙවිය යුතුය. එකී අධිභාරය 20% ක උපරිමයකට යටත් විය යුතුය. දායක මුදල් නොගෙවනු ලබන සමූපකාර සමිතියකින් හෝ සංගමයකින් අධිභාරයක් අය කිරීම.

08. (1) රීති මගින් නියම කරනු ලබන නියමයන් හා කාර්ය පටිපාටියට අනුව යම් දායකයෙකුට යෝජනා ක්‍රමය යටතේ හිමවන ප්‍රතිලාභය අධ්‍යක්ෂකවරයා ඇතුළු පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතුය. දායකත්වයේ කාල සීමාව, දායකයාගේ වයස සහ දායකයා විසින් ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය මත එකී ප්‍රතිලාභයන් ගණනය කළ යුතුය. ප්‍රතිලාභ අධ්‍යක්ෂකවරයා සහ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු බව.

(2) මෙම යෝජනා ක්‍රමයට බැඳෙන්නාවූ (මෙහි මින් මතු "දායක" යනුවෙන් සඳහන් කරනු ලබන) සමූපකාර සේවකයෙකු රීති මගින් නියම කරනු ලබන ආකාරයට මෙම යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබිය යුතුය:— යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ.

(අ) නියම කරනු ලැබිය හැකි පරිදි කාල පරිච්ඡේද අනුව විශ්‍රාම වැටුප;

(ආ) නියම කරනු ලැබිය හැකි පරිදි කාල පරිච්ඡේද අනුව (මින්මතු "පාරිතෝෂික" නමින් දැක්වෙන) මරණ පාරිතෝෂිකය.

(3) දායකත්වයේ කාල සීමාව, දායකයාගේ වයස සහ දායකයා විසින් ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප් හෝ මරණ පාරිතෝෂිකය හෝ ගෙවීමේ පදනම රීති මගින් නියම කරනු ලැබිය යුතුය.

09. (1) දායකයාගේ වයස අවුරුදු 60 වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේය. විශ්‍රාම වැටුප් ගෙවිය යුතු අවස්ථා.

එසේ වුව ද, තම දායක මුදල් ගෙවීම ආරම්භ කළ දායකයෙකු නියම කරනු ලබන ඔහුගේ මුළු දායක මුදල් ප්‍රමාණය ගෙවා අවසන් වුවද, විශ්‍රාම වැටුපකට හිමිකම ලබනුයේ යෝජනා ක්‍රමය අනුමත වී වසරක කාලයක් ඉකුත් වීමෙන් පසුවය.

(2) දායකයා මාසයේ කුමන දිනයක මියගිය ද, එම ලිත් මාසයේ විශ්‍රාම වැටුපට හිමිකම ලබන්නේය.

10. විශ්‍රාම වැටුපට හිමිකම් ලැබීමට පෙර දායකයා මියගිය විටෙක, 8(2) (ආ) ඡේදයෙන් සහ රීතිවලින් නියම කර ඇති ආකාරයට යැපෙන්නන් හට නියම කරනු ලබන මරණ පාරිතෝෂිකය ගෙවිය යුතුය. මරණ පාරිතෝෂිකය ගෙවීම.

11. (1) විශ්‍රාම වැටුපට හිමකම් ලැබීමට පෙර, සේවා යෝජක වූ සමූපකාර සමිතියට හෝ සංගමයට දායකයෙකු අලාභයක් සිදුකොට ඇති බව නීත්‍යානුකූල පරීක්ෂණයකින් හා/හෝ අධිකරණ ක්‍රියාවලියක් තුළින් සනාථ වී තිබේ නම්, මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රතිලාභ හිමිකමකට හෝ විශ්‍රාම වැටුපකට ඔහු හිමිකම් නොලබන්නේය. විශ්‍රාම වැටුපට හිමිකම් නොලැබීම.

එසේ වුවද සේවා යෝජක වූ සමූපකාර සමිතියට හෝ සංගමයට සිදු කළ අලාභය ප්‍රතිපූර්ණය කොට යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට රීති මගින් නියම කරනු ලබන ආකාරයට හා 12 වන වගන්තියේ විධිවිධාන අනුව දායකයාට හිමිකම් ඇත්තේය.

(2) (අ) යම් දායකයෙකු සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී සිය සේවා යෝජක වූ සමූපකාර සමිතියට හෝ සංගමයට අලාභයක් සිදුකොට ඔහුට එරෙහිව නීත්‍යානුකූල පරීක්ෂණයක් හා/හෝ අධිකරණ ක්‍රියාවලියක් සිදුවෙමින් පවතී නම්, එම පරීක්ෂණය හෝ අධිකරණ ක්‍රියාවලිය අවසන් වනතුරු මෙම ප්‍රඥප්තිය යටතේ ඒ දායකයාට ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් තාවකාලිකව නතර කිරීමේ බලය අධ්‍යක්ෂවරයාට ඇත්තේය. පරීක්ෂණයක් හෝ අධිකරණ ක්‍රියාවලියක් පැවැත්වෙන විට විශ්‍රාම වැටුප තාවකාලිකව නතර කිරීම.

පාලක මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.

(ආ) ඉහත (අ) ඡේදය යටතේ දායකයාට එරෙහිව පැවැත්වෙන නීත්‍යානුකූල පරීක්ෂණයක් හෝ අධිකරණ ක්‍රියාවලියක් වසරකට වඩා ප්‍රමාද වුවහොත්, තාවකාලිකව නතර කරනු ලැබූ විශ්‍රාම වැටුප තමාට ගෙවන ලෙසට වන ඉල්ලීමක් දායකයෙකු විසින් 14 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලබන පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැක්කේය. එම ඉල්ලීම සලකා බැලීමෙන් පසු පාලක මණ්ඩලයේ තීරණය දායක වෙත ලිඛිතව දැන්විය යුතු අතර එම තීරණය අනුව අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියා කළ යුත්තේය.

නිදහස් වූ විට විශ්‍රාම වැටුප් ලැබීම.

(ඇ) (අ) ඡේදය යටතේ දායකයා සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ නීත්‍යානුකූල පරීක්ෂණයේදී දායකයා නිදහස් වුවහොත් විශ්‍රාම ලැබූ දින සිට විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම ඇත්තේය.

එක් එක් දායකයා වෙත අධ්‍යක්ෂ වරයා විසින් විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රයක් නිකුත් කළයුතු බව.

12. (1) සමුපකාර සේවකයෙකු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයෙකු ලෙස බඳවා ගනු ලැබූ විට, අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය. එම හිමිකම් පත්‍රයේ පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතුය:—

(අ) දායකයා වෙත නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය යටතේ හිමිවන ප්‍රතිලාභ.

(ආ) දායකයා විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල වන මූලික වැටුපෙන් 5% ක මුදල;

(ඇ) සේවා යෝජක සමුපකාර සමිතිය හෝ සංගමය විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල වන දායකයාගේ මූලික වැටුපෙන් 2.5% ක මුදල;

(ඈ) විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රයේ නියමයන් සහ කොන්දේසි:

(i) සේවා කාලය පදනම් කරගෙන අවම සේවා කාලය වන අවු 10 සහ උපරිම සේවා කාලය වන අවු 41 මත පිළිවෙලින් 80% සිට 44% දක්වා වූ විශ්‍රාම වැටුපකට දායකයා හිමිකම් ලබනු ඇත.

(ii) ඉහත (ඇ) යටතේ සඳහන් විශ්‍රාම වැටුප ගෙවීමේදී දායකයාගේ දායක මුදල සහ සමුපකාර සමිතියේ හෝ සංගමයේ දායක මුදල යන දෙකෙහි එකතුවට වඩා අඩුවන මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභියාගේ අයිතිවාසිකමට ඇත්නම් එය සමුපකාර සංවර්ධන අරමුදල විසින් දරනු ඇත.

(iii) කෙසේ නමුත් ඉහත සඳහන් දායකත්ව මූලාශ්‍රයන් ව්‍යර්ථවීම හේතුකොටගෙන ප්‍රතිලාභියාට ඇතිවන පාඩුවකට අරමුදල වගනොකියනු ඇත.

දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති විට ප්‍රතිලාභ අහිමිවීම.

(2) විශ්‍රාම වැටුප් අරමුදලට දායකයෙකු විසින් ගෙවිය යුතු දායක් මුදල් සේවා යෝජක සමිතිය/සංගමයේ ප්‍රමාද දෝෂයකින් නොගෙවා ඇති අවස්ථාවක හැර, දායකයකු විසින් වාරික තුනක් ගෙවීම පැහැර හැර ඇති විටෙක දායකයා වෙත නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය යටතේ වූ ප්‍රතිලාභ සඳහා හිමිකම නොලැබෙන්නේය.

ප්‍රතිලාභ අහිමිවී ඇති විට අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව දැන්විය යුතු බව.

(3) (1) උප වගන්තිය යටතේ නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රයේ සඳහන් ප්‍රතිලාභ යම් දායකයෙකු වෙත අහිමි වී ඇති අවස්ථාවක එසේ අහිමිවී ඇති බවට තීරණයකර මාස තුනක් ඉකුත්වීමට පෙර ඒ බව අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව දායකයා වෙත දැන්විය යුතුය.

පාලක මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.

(4) (2) උප වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය අවලංගු කර ඇති බව දැන්වූ විට එම විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය වලංගු කරවා ගැනීම සඳහා 14 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති පාලක මණ්ඩලය වෙත මාස 03 ක් ඇතුළත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ අයිතිය දායකයෙකුට ඇත්තේය.

(5) (4) උප වගන්තිය යටතේ දායකයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ තීරණය දින 30ක් තුළ දායකයා වෙත ලිඛිතව දැන්විය යුතුය.

(6) (අ) (5) උපවගන්තියේ විධිවිධාන පරිදි පාලක මණ්ඩලය දායකයාගේ විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය වලංගු කිරීමට තීරණය කර ඇති අවස්ථාවකදී පැහැර හැර ඇති වාරික මුදල් ගෙවීමට නිශ්චිත දිනයක් අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත ලිඛිතව දැන්විය යුතුය.

(ආ) (අ) ඡේදය යටතේ දන්වන ලද නිශ්චිත දිනට පෙර දායක මුදල් ගෙවීම දායකයා විසින් පැහැර හැර ඇති විට විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය අවලංගු වූවාසේ සැලකිය යුතු අතර, නැවත පාලක මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ අයිතිය දායකට නොමැත්තේය.

(ඇ) ඉහත (ආ) ඡේදය යටතේ දෙන ලද තීරණයෙන් අතෘප්තියට පත් දායකයෙකුට 15(1) වගන්තිය යටතේ පිහිටවනු ලබන අභියාචනා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර එකී අභියාචනා මණ්ඩලයේ තීන්දුව අවසානාත්මක වන්නේය. අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව.

13. (1) යම් සමූපකාර සමිතියක් හෝ සංගමයක් නීතිය අනුව ඈවර කිරීම සඳහා සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචිය අවලංගු කර ඇති විටෙක, සේවා යෝජක සමූපකාර සමිතියේ හෝ සංගමයේ හෝ ලියාපදිංචිය අවලංගු කරන දිනය දක්වා දායකයා වෙනුවෙන් අරමුදලට දායක මුදල් ගෙවා ඇත්තේ නම් රීති අනුව නියම කරන ආකාරයට විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. සමූපකාර සමිතිය හෝ සංගමය ඈවර කිරීම, ඒකාබද්ධ කිරීම, විබද්ධ කිරීම මත විශ්‍රාම වැටුප අහිමි නොවිය යුතු බව.

(2) එවැනි සමූපකාර සමිතියක් හෝ සංගමයක් බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචිය අවලංගු කර, ඈවර කරන අවස්ථාවේදී මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී ඇති, එම සමිතියේ හෝ සංගමයේ සියලුම දායකයන්ට එකී ඈවර කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් වී ඔවුන්ගේ හිමිකම් එමගින් අයකර ගැනීමට අයිතිය ඇත්තේය.

(3) යම් සමූපකාර සමිතියක් හෝ සංගමයක්, නීතිය අනුව යම් සමූපකාර සමිතියක් හෝ සංගමයක් සමඟ ඒකාබද්ධ වන්නේ නම් හෝ යම් සමූපකාර සමිතියක් හෝ සංගමයක් නීතිය අනුව යම් සමූපකාර සමිති හෝ සංගම්වලට විබද්ධ වන්නේ නම්, එම ඒකාබද්ධවීම හෝ විබද්ධවීම දායකයාට මෙම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට ඇති හිමිකමේ අයිතිය අහිමිවීමක් සේ නොසැලකිය යුතු අතර, නව සේවා යෝජක සමිතිය හෝ සංගමය, දායකයා අඛණ්ඩව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ රැඳී සිටි බවට සැලකිය යුත්තේය.

14. (1) මෙම ප්‍රඥප්තියේ 8(1) උප වගන්තිය යටතේ හෝ 11(2) උප වගන්තිය යටතේ හෝ 12(2) උප වගන්තිය යටතේ, හෝ අධ්‍යක්ෂවරයාගේ තීරණය පිළිබඳව අතෘප්තියට පත් යම් දායකයෙකුට, ඒ සම්බන්ධයෙන් නැවත සලකා බැලීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා ද, සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල පාලනය කිරීම සඳහා ද, අධ්‍යක්ෂවරයාට මග පෙන්වීම සඳහා ද, සමූපකාර සේවක විශ්‍රාම වැටුප් පාලක මණ්ඩලයක් මෙයින් පිහිටුවනු ලැබේ. පාලක මණ්ඩලය පිහිටුවීම.

(2) විශ්‍රාම වැටුප් පාලක මණ්ඩලය හත් දෙනෙකුට නොවැඩි ගණනකින් සමන්විත විය යුතු අතර එහි සාමාජිකයන් වශයෙන් පහත අය පත් කළ යුතු වේ:- පාලක මණ්ඩලයේ සාමාජිකයන්.

(අ) බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ;

(ආ) බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්;

(ඇ) කම්කරු කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙක්;

(ඈ) විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වසර 05කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු නොවූ බස්නාහිර පළාතේ සමූපකාර සමිතියක/සංගමයක සභාපතිවරයෙක්.

(ඉ) විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කළමනාකරණය හා මූල්‍ය කටයුතු පිළිබඳ දැනීමක් ඇති උසාවියකින් වරදකරුවකු නොවූ බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුන නියෝජනය කරන සමූපකාර සේවකයින් අතරින් තිදෙනෙක්

සාමාජිකයන්ගේ ධුර කාලය.

(3) (අ) ඉහත සාමාජිකයන් අතුරෙන් (අ), (ආ) ඡේද යටතේ සඳහන් තැනැත්තන්ගේ ධුර කාලය ඔවුන්ගේ නිල තනතුරට අයත් ධුර කාලයට සීමා වන්නේය.

(ආ) (ඇ) ඡේදයෙහි සඳහන් සාමාජිකයා කම්කරු කොමසාරිස් ජනරාල් ම වන අවස්ථාවකදී ඔහුගේ ධුර කාලය එකී ධූරය දරන කාලයට සීමා වන්නේය.

(ඇ) කම්කරු කොමසාරිස් ජනරාල් වරයා විසින් නම් කරනු ලබන අයෙකු සාමාජික වන අවස්ථාවකදී එම තැනැත්තාගේ ධුර කාලය ඔහු මිය යාම හෝ ඉල්ලා අස්වීම හෝ යන හේතු මත එකී ධූරය හිස් වුවහොත් මිස අවුරුදු 03ක කාලසීමාවකට විය යුතුය. එසේ වුවද කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් වෙනත් අයෙකු එම තනතුර සඳහා පත් කිරීම මත මුලින් පත් කළ නිලධාරියාගේ පත්වීම අහෝසි වන්නේය.

(ඈ) මෙම ප්‍රඥප්තියේ 14(2) (ඈ), (ඉ) ඡේද යටතේ පාලක මණ්ඩලයට පත් කරනු ලබන සාමාජිකයකු මිය යාමෙන් හෝ කවර හෝ අවස්ථාවක දී අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මඟින් ඉල්ලා අස්වීමෙන් හෝ අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබීමෙන් හෝ ධූරය හිස් වුවහොත් මිස අවුරුදු 03 ක කාල පරිච්ඡේදයක් සඳහා ධූරය දැරිය යුතුය.

(ඉ) පාලක මණ්ඩලයේ 14(2) (ඈ), 14(2) (ඉ) ඡේද යටතේ පත් කළ සාමාජිකයකු ඉහත දැක්වෙන පරිදි ධූරය හිස් කරන ලද අවස්ථාවක මෙහි පහත (ඊ) ඡේදයේ විධිවිධාන ගැන සැලකිලිමත්ව ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කළ යුතු අතර, ඒ සාමාජිකයා තමා පත් කරනු ලැබීමට හේතු වූ අනුප්‍රාප්තිකයාගේ ඉතිරිව ඇති ධූර කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(ඊ) රෝගාතුර වීමෙන් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීමෙන් හෝ වෙනත් යම්කිසි හේතුවක් නිසා හෝ පාලක මණ්ඩලයට පත් කළ සාමාජිකයාට තම කාර්යය ඉටු කර ගැනීමට නොහැකි බව අනාවරණය වුවහොත් ඔහු ගේ වැඩ ආවරණය සඳහා වෙනත් අයකු අමාත්‍යවරයා විසින් පත් කළ යුතු වේ.

(උ) ධූරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු හැර ධූරය හිස් කරන පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙකු වන්නේය.

(4) බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්වරයා පාලක මණ්ඩලයේ සභාපති වන්නේය. ඔහු සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. පාලක මණ්ඩලයේ යම් රැස්වීමකට ඔහු පැමිණ නොමැති විටෙක පාලක මණ්ඩලයේ සාමාජිකයන් අතරින් පත් කරනු ලබන අයකු රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(5) අධ්‍යක්ෂවරයා පාලක මණ්ඩලයේ ලේකම් වේ. ඔහු විසින් පාලක මණ්ඩලයේ රැස්වීම් වලට සාමාජිකයන් කැඳවිය යුතු අතර එම රැස්වීම් මෙම ප්‍රඥප්තිය යටතේ යෝජනා ක්‍රමයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන අන්දමින් පැවැත්විය යුතු ය.

(6) ලේකම්වරයා ගේ කාර්යයන් රීති මගින් නියම කළ යුතු ය.

(7) පාලක මණ්ඩලයේ පුරප්පාඩුවක්/පුරප්පාඩු පවතින අවස්ථාවක දී එකී පාලක මණ්ඩලය විසින් ගනු ලබන තීරණයන් එකී පුරප්පාඩු හේතුවෙන් අවලංගු නොවිය යුතු ය.

ගණ පූරණය.

(8) පාලක මණ්ඩලයේ ගණ පූර්ණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

පාලක මණ්ඩලයේ දීමනා.

(9) පාලක මණ්ඩලයේ රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් පාලක මණ්ඩලයේ සාමාජිකයන්ට ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ගමන් වියදම් දීමනා හා අනෙකුත් දීමනා ද ඇතුළත් වන පරිදි පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැක.

15.(1) අධ්‍යක්ෂවරයාගේ සහ මෙම ප්‍රඥප්තියේ 12(6)(අ) ඡේදය යටතේ පාලක මණ්ඩල විසින් දෙනු ලැබූ තීරණයෙන් අතෘප්තියට පත් යම් දායකයෙකුට, අභියාචනා කිරීම සඳහා මතු සඳහන් පරිදි තිදෙනෙකුගෙන් සමන්විත අභියාචනා මණ්ඩලයක් මෙයින් පිහිටුවනු ලැබේ. අභියාචනා මණ්ඩලය පිහිටුවීම.

(2) අභියාචනා මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය:- අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන්.

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම් ධූරයකට සමාන හෝ නොඅඩු ධූරයක් දරන නිලධාරියෙකු ;

(ආ) බස්නාහිර පළාත් සභාවේ සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති ;

(ඇ) වසර 05කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු නොවූ බස්නාහිර පළාතේ සමූපකාර සමිතියක/සංගමයක සභාපතිවරයෙක් ;

(ඈ) වසර 10 කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු නොවූ බස්නාහිර පළාතේ සමූපකාර සමිතියක/සංගමයක සේවකයන් දෙදෙනෙක්.

(3) අභියාචනා මණ්ඩලයේ සභාපති 15(2) අ ඡේදය යටතේ පත්කරනු ලබන නිලධාරියා වන්නේය. අභියාචනා මණ්ඩලයේ සභාපති

(4) අධ්‍යක්ෂවරයා අභියාචනා මණ්ඩලයේ ලේකම් වේ. ඔහු විසින් අභියාචනා මණ්ඩලයේ රැස්වීම් වලට සාමාජිකයන් කැඳවිය යුතු අතර එම රැස්වීම් මෙම ප්‍රඥප්තිය යටතේ යෝජනා ක්‍රමයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන අන්දමින් පැවැත්විය යුතුය.

(5) අධ්‍යක්ෂවරයාගේ තීරණයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවූ යම් දායකයෙකු අධ්‍යක්ෂවරයාගේ තීරණය ලැබී දින 60ක් ඇතුලත, (1) උපවගන්තිය යටතේ පිහිටුවන ලබන අභියාචනා මණ්ඩලය වෙත තම අභියාචනයට හේතු සඳහන් කරමින් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ලේකම්වරයා ගේ කාර්යයන් රීති මගින් නියම කළ යුතු ය.

(6) අභියාචනා මණ්ඩලයේ පුරප්පාඩුවක්/පුරප්පාඩු පවතින අවස්ථාවක දී එකී අභියාචනා මණ්ඩලය විසින් ගනු ලබන තීරණයන් එකී පුරප්පාඩු හේතුවෙන් අවලංගු නොවිය යුතු ය.

(7) අභියාචනා මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකු විය යුතු ය. ගණ පූරණය.

(8) අභියාචනා මණ්ඩලය වෙත ගෙවනු ලබන දීමනා, ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය. අභියාචනා මණ්ඩලයේ දීමනා.

(9) පාලක මණ්ඩලයේ තීරණයක් සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවූ යම් දායකයෙකුට එකී තීරණය ලැබී දින 60 ක් ඇතුළත, 15(1) වගන්තිය යටතේ පිහිටුවන ලබන අභියාචනා මණ්ඩලය වෙත තම අභියාචනයට හේතු සඳහන් කරමින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. දින 60ක් තුළ අභියාචනා කළ යුතු බව.

(10) අභියාචනා මණ්ඩලය වෙත අභියාචනය ලැබීමෙන් පසු දින 90ක් තුළ අභියාචනා මණ්ඩලයේ තීරණය අභියාචක වෙත දැන්විය යුතු ය. දින 90ක් තුළ අභියාචනා තීරණය ලබාදිය යුතු බව.

16. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ දායකයකු විසින් හිමිකම් ලබන විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක්, පවරාදීම හෝ අන්සතු කිරීම හෝ නොකළ යුතු අතර, සෑම පවරා දීමක් හෝ අන්සතු කිරීමක් ශූන්‍ය හා බල රහිත වන්නේ ය. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ පැවරිය නොහැකි බව.

මේ ප්‍රඥප්තිය යටතේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රීති මගින් හෝ අධ්‍යක්ෂවරයාට පැවරී ඇති බලතල යටතේ හැර, දායකයකු වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක්, දායකයාගෙන් බාහිර පාර්ශ්වයක් වෙත ලැබිය යුතු ණයක් හෝ ගෙවීමක් වෙනුවෙන්, එකී විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ දීමනාව

දායකයා වෙත ලබා දීම තහනම් කිරීමේ රිට් ආඥාවක් හෝ එකී ණය හෝ ගෙවීම අය කර ගැනීම සඳහා රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීම තුළින් එම මුදල් අය කර ගැනීමට කටයුතු කිරීමට බාහිර පාර්ශ්වයකට මෙම ප්‍රඥප්තිය යටතේ හිමිකම නොමැත්තේය.

III කොටස

සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල

සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවීම.

17. (1) මෙහි මින්මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) එම අරමුදලට පහත දැක්වෙන ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් ප්‍රේෂණය කළ යුතුය:-

(අ) මෙම ප්‍රඥප්තිය යටතේ පණවනු ලබන රීති මගින් නියම කරනු ලබන විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයින්ගේ හා සමූපකාර සමිති හා සමූපකාර සංගම්වල දායක මුදල්;

(ආ) සමූපකාර අරමුදලින් ප්‍රේෂණය කරනු ලබන්නා වූ මුදල්;

(ඇ) යම් සමූපකාර සමිතියකින් හෝ සංගමයකින් හෝ වාර්ෂිකව හෝ කලින් කලට ප්‍රේෂණය කරනු ලබන්නා වූ මුදල්;

(ඈ) ආයෝජනවලින් උපයා ගන්නා ලද පොළී හා ලාභ වශයෙන් ලැබෙන සියලුම මුදල්;

(ඉ) අරමුදල වෙත ලැබෙන ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් යම් ප්‍රභවයන්ගෙන් ලැබෙන සියළු මුදල්;

(ඊ) මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ ණයට ලබා ගන්නා ලද මුදල්.

IV කොටස

මූල්‍ය කටයුතු, ගිණුම් තැබීම හා විගණනය

ගිණුම් පවත්වා ගෙන යාම.

18. (1) මෙම අරමුදලේ කාර්ය සඳහා රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් පවත්වා ගෙන යා යුතු ය.

අරමුදලින් කරනු ලබන ගෙවීම්.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයා ඇතුළු පාලක මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය හා කර්තව්‍යය ඉටු කිරීමේදී දරනු ලබන යම් පරිපාලන වියදම් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) මෙම අරමුදලින් සිදු කරනු ලබන සෑම ගෙවීමක්ම රීති මගින් නියම කර ඇති ආකාරයට සිදුකළ යුතු ය.

මුදල් ආයෝජනය කිරීම.

19. මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් විශ්‍රාම වැටුප් ගෙවීම සහ පරිපාලනය සඳහා වන වියදම් දැරීමෙන් පසු වහාම අවශ්‍ය නොවන්නාවූ අරමුදලේ සියළු මුදල්, රාජ්‍ය බැංකුවක හෝ රාජ්‍ය අරමුදල් වල ආයෝජනය කරනු ලැබිය යුතු ය.

මුදල් ණයට ගැනීමේ බලතල.

20. රීති මගින් නියම කරනු ලැබ ඇති ආකාරයට අධ්‍යක්ෂවරයා විසින්, යෝජනා ක්‍රමය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වන්නාවූ මුදල්, පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව බැංකු අයිරාවන් මාර්ගයෙන් හෝ සමූපකාර සමිතියකින්, සංගමයකින් හෝ රාජ්‍ය මූල්‍ය ආයතනයකින් ණයට ගැනීම සිදු කරනු ලැබිය හැකිය.

මුදල් වර්ෂය.

21.(1) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතුය.

ගිණුම් තැබීම.

(2) රීතිවලින් නියම කරනු ලැබ ඇති ආකාරයට ගිණුම් තැබීම අධ්‍යක්ෂවරයාගේ යුතුකම හා වගකීමක් වන්නේය.

විගණකාධිපති වෙත අවසාන ගිණුම් ඉදිරිපත් කළයුතු බව.

(3) අධ්‍යක්ෂවරයා විසින් සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 වන දිනට පැවති ආකාරයට යෝජනා ක්‍රමයේ පොත්පත් තුලනය කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, එකී දිනයට ආදායම් හා වියදම් ගිණුමක් හා වත්කම්වල හා බැරකම්වල සාරාංශයක් අඩංගු ශේෂ පත්‍රයක් ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

ගිණුම් විගණනය.

22. විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව යටතේ විගණකාධිපතිවරයාට ඇති බලතල බල පැවැත්වෙන්නේය.

V කොටස

පොදු විධිවිධාන

23. (1) නියම කළ යුතුයැයි මෙම ප්‍රඥප්තියේ අංක 3(1), 7(3), 8(1), 8(2), 8(3), 10, 11(1), 13(1), 14(6), 15(5), 17(2) (අ), 18(3), 19, 20 21(2) යටතේ සඳහන් කරුණු හා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැක්කේය:—

(අ) යෝජනා ක්‍රමය විසින් විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(ආ) සමූපකාර සේවකයෙකු යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ලැබීම සඳහා සුදුසුකම්, කොන්දේසි සහ අවස්ථානුගත කරුණු සහ සීමා කිරීම් පිළිබඳ;

(ඇ) දායකයන් විසින් හා දායකයන් වෙනුවෙන් සේවා යෝජක සමූපකාර සමිති හෝ සංගම් විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් ප්‍රමාණය;

(ඈ) දායකයින් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හා දීමනා ගෙවීම සඳහා වන නිර්ණායක පිළිබඳ;

(ඉ) දායක මුදල් ගෙවීම පැහැර හැර ඇතිවිට ප්‍රතිලාභ ගෙවීමට අදාළව කොන්දේසි;

(ඊ) පාලක මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය පිළිබඳ රීති සකස් කිරීම;

(උ) අභියාචනා මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය පිළිබඳ රීති සකස් කිරීම;

(ඌ) විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රයේ ප්‍රතිලාභ ලබාදීමට අදාළ කොන්දේසි සකස් කිරීම;

(එ) මරණ පාරිතෝෂිකය ගෙවීමේ කොන්දේසි සහ ප්‍රමාණ;

(ඒ) 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය යටතේ, සමූපකාර සමිතියක හෝ සංගමයක ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ විට, සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු ප්‍රතිලාභ;

(ඔ) අදාළ ආකෘති පත්‍ර නියම කිරීම;

(ඕ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දිනට පෙර සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබන සමිති හෝ සංගම් කටයුතු කළයුතු ආකාරය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම, ගැසට් පත්‍රයේ පළ කල යුතු ය. එසේ පළකරනු ලබන දිනයේ දී හෝ රීතිවල සඳහන් පසු දිනයක දී එය ක්‍රියාත්මක විය යුතුය.

අනනුමතය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම, ඒ රීති ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි ඉක්මනින් පළාත් සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම රීතියක්ම ඒ අනනුමතයේ දින සිට, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4) රීතියක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

VI කොටස

දායක මුදල් හා දඩ මුදල් නොගෙවා පැහැර හැරීම

24. (1) ලියාපදිංචි කළ සමූපකාර සමිතියක් හෝ සංගමයක් විසින් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල, මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති ආකාරයෙන් නොගෙවා වාරික තුනක් ඉක්මවූ පසු එම මුදල අදාළ අධිභාරය සමඟ දින 14ක් ඇතුළත ගෙවන ලෙස අධ්‍යක්ෂවරයා විසින් නියෝගයක් නිකුත් කළ යුතු ය.

(2) ඉහත (1) උප වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද නියෝගය පරිදි දින 14ක් ඇතුළත අදාළ මුදල සහ අධිභාරය ගෙවීමට කටයුතු නොකළ, (මින් මතු "පැහැර හරින්නා" යනුවෙන් හඳුන්වනු ලබන) සමූපකාර සමිතියක්, සමූපකාර සංගමයක්, හා එහි අධ්‍යක්ෂකවරයෙකු, නිලධාරියකු හෝ සේවකයෙකු වෙත, අධ්‍යක්ෂවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ නඩු පවරන බවට දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(3) ඉහත (2) උප වගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කිරීමෙන් පසුව නඩු පැවරීම සඳහා අධ්‍යක්ෂකවරයා විසින් —

(අ) ඒ මුදල හා අධිභාරය පිළිබඳ විස්තර සහ පැහැර හරින්නා හෝ පැහැර හරින්නන්ගේ නම් අඩංගු සහතිකයක්, ඒ පැහැර හරින්නා හෝ පැහැර හරින්නන් සතු චංචල හෝ නිශ්චල දේපලක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණයක් වෙත හෝ ;

(ආ) ඒ මුදල හා අධිභාරය පිළිබඳ විස්තර සහ පැහැර හරින්නා හෝ පැහැර හරින්නන්ගේ නම් සහ අවසානයට දැනගත් ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචිව සිටින ස්ථානය පිළිබඳ විස්තර ඇතුළත් සහතිකයක් ඒ ස්ථානය පිහිටි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයෙකු වෙත හෝ ;

(2) උප වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් නඩු පවරන බවට සිදු කරන ලද දැන්වීම පරිදි (අ) ඡේදය යටතේ අධ්‍යක්ෂවරයා විසින් සහතික කරන ලද සහතිතයක් දිසා අධිකරණය වෙත හෝ (ආ) ඡේදය යටතේ අධ්‍යක්ෂවරයා විසින් සහතික කරන ලද සහතිකයක් මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ නඩු පැවරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් කටයුතු කරනු ලැබිය යුතුය.

(4) ඉහත (3) (අ) වන ඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක එය ලැබීමෙන් පසු ඒ අධිකරණය විසින් ඒ පැහැර හරින්නාගේ සියලුම චංචල හෝ නිශ්චල දේපල හෝ ඉන් යමක් හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා පිස්කල් විසින් අවශ්‍ය යැයි සැලකිය හැකි ඉන් යම් කොටසක් තහනමට ගෙන විකුණන ලෙස පිස්කල්ට බලය පැවරෙන හා නියම කෙරෙන දේපල තහනම් ඇස්කීසියක් පිස්කල් වෙත නිකුත් කරන ලෙස විධාන කළ යුතු ය. ඒ තහනමට ගෙන විකිණීම කෙරෙහි සහ ඊට අදාළව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්ති දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(5) ඉහත (3) (ආ) වන ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත සහතිකයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, මුදල් අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව වැඩිදුරටත් ක්‍රියා නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් ඒ පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම් බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි වුවද, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදකට එම පැහැර හරින්නා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරුණු දඩයක් ලෙස ඒ මුදල සලකනු ලැබිය යුතුය. එවිට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 291 වගන්තියේ එහි (1) වන උප වගන්තියේ (අ) සහ (ඈ) ඡේද හැර විධිවිධාන ඇතුළත් විය යුතු අතර, ඒ දණ්ඩන නියමය කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ යුතුව තිබූ යම් විධානයක් ඔහු විසින් කළ යුතුය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 291 වගන්තිය අනුව නියම කරනු ලැබූ දඩය පැහැර හැරීමෙහිලා බන්ධනාගාර ගත කිරීමේ කාලයට දණ්ඩන නියමයක් කරනු ලැබූ යම් පැහැර හරින්නෙකු (3) (ආ) වගන්තියේ සඳහන් සහතිකයෙහි නිශ්චිතව සඳහන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් නිදහස් කරනු නොලැබිය යුතුය.

(6) අධ්‍යක්ෂවරයා විසින් (3) උප වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන අවස්ථාවක ඒ පිළිබඳ නිවේදනයක් පෞද්ගලිකව භාර දීමෙන්, හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ විදුලි පණිවිඩ මාර්ගයෙන් හෝ පැහැර හරින්නා වෙත නිකුත් කළ යුතුය. එසේ නිකුත් කිරීමෙන් ඒ නිවේදනය පැහැර හරින්නා වෙත ලැබුනා සේ සලකා එම නීති කෘත්‍ය පවත්වා ගෙන යා යුතුය.

(7) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යවලදී අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කළ සහතිකයෙහි වූ යම් ප්‍රකාශයක නිවැරදිභාවය සලකා බැලීමට, පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳ තීරණය කිරීමට යම් දිසා අධිකරණයකට හෝ මහේස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතු ය.

(8) ඉහත (4) වන උප වගන්තිය යටතේ විකිණීමෙන් ලද යම් මුදලක් හා (5) වන උප වගන්තිය යටතේ ගෙවන ලද හෝ අයකරන ලද යම් මුදලක් අවස්ථාවෝචිත පරිදි දිසා අධිකරණය හෝ මහෝස්ත්‍රාත් අධිකරණය විසින් අධ්‍යක්ෂවරයා වෙත එවිය යුතුය.

VII කොටස

වෙනත් කරුණු

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ —

"පළාත් සභාව" යනුවෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් වේ.

"අමාත්‍යවරයා" යනුවෙන් තත්කාලයේ බස්නාහිර පළාතේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"සමූපකාර සමිතියක්" යනුවෙන් බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ දී ඇති අර්ථනිරූපනයම අදාළ වේ.

"සමූපකාර සංගමයක්" යනුවෙන් බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 3 (1) (ආ) ඡේදයේ සඳහන් පරිදි ස්වකීය සාමාජිකයින් වශයෙන් ලියාපදිංචි සමිතිවලින් සමන්විත සමිතියක් වන්නේය.

"සේවකයා" යනුවෙන් 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව හා බස්නාහිර පළාත් සභාවේ 1994 අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ අර්ථානුකූලව සමූපකාර සමිතියක හෝ සංගමයක ස්ථිර පත්වීමක් ලද සේවකයෙක්, අදහස් වේ.

"නීත්‍යානුකූල පරීක්ෂණයක්" යනුවෙන් බස්නාහිර පළාත් සභාවේ 1994 අංක 1 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ විධිවිධාන අනුව හා බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ විධිවිධාන අනුව සිදුකරන ලද පරීක්ෂණයක් අදහස් වේ.

අනනුකූලතාවය බල පැවැත්වීම.

26. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

12 - 129

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.